අග්‍රාමාත්‍ය කාර්යාලය - සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය
பிரதம அமைச்சர் அலுவலகம் - நல்லிணக்கப் பொறிமுறைகளைக் கூட்டிணைப்பதற்கான செயலகம்
Prime Minister's Office -Secretariat for Coordinating Reconciliation Mechanisms

# මාධ්‍ය නිවේදනය (25-08-2016)

## සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට එහි වැඩසටහන් සහ ක්‍රියාවලි සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබේ.

මනෝ තිත්තවැල්ල මහතා 2016 මාර්තු 23 වනදා සිට සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ මහ ලේකම් ධූරයට පත් කර ඇති බව තහවුරු කිරීම පිණිසයි. සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය 2015 දෙසැම්බර් මස කැබිනට් මණ්ඩල තීරණයකින් ශ්‍රී ලංකාවේ සියලු සංහිඳියා ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා පත් කරන ලද ඉහළ ආයතනයකි.

මෙම කාර්යාලය අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කොට ඇති අතර එහි මහ ලේකම්වරයා ගරු අග්‍රාමාත්‍යවරයා වෙත ඍජුවම වාර්තා කරන අතර එතුමා තුළින් අතිගරු ජනාධිපතිතුමා වෙත වාර්තා කරනු ලැබේ. අවසාන කැබිනට් මණ්ඩල රැස්වීමේදී කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ ව්‍යුහය සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අනුමත කොට ඇත. ඒ අනුව, අබේසිංහ ආරච්චිගේ දයානන්ද මහතා ආයතනික පරිපාලන සහ මූල්‍ය ප්‍රධානී ලෙස පත් කොට ඇත.

මෑතකදී පනවන ලද අතුරුදන් වූවන්ගේ කාර්යාලයේ (OMP) සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කිරීමට නියමිත වන අතර ඔවුන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඍජුව වග කියනු ඇත. තිත්තවැල්ල මහතා මෙම අතුරුදන් වූවන්ගේ කාර්යාලයේ ලේකම්වරයා හෝ සාමාජිකයෙකු නොවේ.

-----------------------

සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය,

www.scrm.gov.lk

ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව
குடியரசுக் கட்டடம், கொழும்பு 1, இலங்கை
The Republic Building, Colombo 01, Sri Lanka
දූරකථන / தொலைபேசி /Phone: +94112325620
ඊ මේල් /மின்அஞ்சல்/Email : contact@scrm.gov.lk